# ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය කෙරෙහි කාර්මික, කෘෂිකාර්මික හා සේවා යන අංශයන්හි දායකත්වයේ උපනතිය.

ආර්.එම්.ජී.ජී. රාජපක්ෂ[1]

**සංක්ෂේපය**

ආර්ථික වර්ධනය මනින ප්‍රධානම සාධකය දළ දේශීය නිෂ්පාදිතය යි. දළ දේශීය නිෂ්පාදිතය තීරණය වන සාධක ලෙස කාර්මික අංශය, කෘෂිකාර්මික අංශය හා සේවා අංශය දැක්විය හැකිය. ක්‍රි. පූ. 6වන ශතවර්ෂයේ ආර්යයන් මෙරටට පැමිණීමේ සිට බ්‍රිතාන්‍යයන් ආක්‍රමණය කරන තුරු යැපුම් කෘෂිකර්මාන්තය පදනම් කරගත් ආර්ථික රටාවක් පැවතුණ අතර බ්‍රිතාන්‍ය ආක්‍රමණත් සමග වැවිලි වගාව මුල් කරගත් ආර්ථික රටාවක් ඇති විය. මෙම වකවානුවේදී මෙන්ම 1948 දී නිදහස ලැබීමේ සිට 1950 ගණන් අවසානයේ ආවෘත ආර්ථිකයක් ආරම්භ වීම දක්වා කාලය තුළ දළ දේශීය නිෂ්පාදිතයට විශාලම දායකත්වයක් ලැබුනේ කෘෂිකාර්මික අංශයෙනි. නමුත් 1977 විවෘත ආර්ථික ප්‍රතිපත්තිය ඇතිවීමත් සමඟම මෙම තත්වය වෙනස් විය. එනම් දළ දේශීය නිෂ්පාදිතයට කෘෂිකාර්මික අංශයේ දායකත්වය තරමක් අඩු වී කාර්මික හා සේවා අංශයේ දායකත්වය වැඩි විය. ඒ අනුව මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ දළ දේශීය නිෂ්පාදිතය කෙරෙහි කාර්මික, කෘෂිකාර්මික හා සේවා යන අංශ ත්‍රිත්වයෙහි ක්‍රියාකාරීත්වය කෙසේද? යන්න අධ්‍යයනය කිරීමයි. මෙම අධ්‍යයනය 1977 සිට 2013 දක්වා කාලය තුළ මහබැංකු වාර්තා මඟින් ලබා ගත් ද්විතියික දත්ත මත පදනම් වේ. ඒ අනුව දළ දේශීය නිෂ්පාදිතය කෙරෙහි කාර්මික අංශය, කෘෂිකාර්මික අංශය හා සේවා අංශයන්ගේ දායකත්වය සරල ප්‍රතිපායන ආකෘති ඇසුරෙන්ද, සේවා අංශය කෙරෙහි තොග හා සිල්ලර වෙළදාම් අංශය සහ ප්‍රවාහන හා සන්නිවේදන අංශයේ දායකත්වය සරළ ප්‍රතිපායන ආකෘති හා බහුගුණ ප්‍රතිපායන ආකෘති ඇසුරෙන්ද ආකෘතීන් හි සමස්ථ වෙසෙසියාව වෙසෙසියා පරීක්ෂා ඇසුරෙන්ද විශ්ලේෂණය කරන ලදී. නිදහසට පෙර යුගයේදී ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය තීරණය වන ප්‍රධාන සාධකය වූයේ කෘෂිකාර්මික අංශයයි. කාර්මීකරණ ප්‍රතිපත්තියත් සමඟම ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට කෘෂිකාර්මික අංශයේ සාපේක්ෂ දායකත්වය අඩු වී කාර්මික අංශයේ සාපේක්ෂ දායකත්වය වැඩි විය. වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ දළ දෙශීය නිෂ්පාදිතයට වැඩිම දායකත්වයක් ලබා දෙන අංශය ලෙස සේවා අංශය කටයුතු කරයි. දළ දේශීය නිෂ්පාදිතයට කාර්මික, කෘෂිකාර්මික හා සේවා යන අංශ 1977 සිට 2013 දක්වා වසර 36ක කාලය තුළදී දැක්වූ දායකත්වය අධ්‍යයනය කරන විට පෙනී යන්නේ කෘෂිකාර්මික නිෂ්පාදනය එක්

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය
ganga01@stu.kln.ac.lk

බිලියනයකින් වැඩි වන විට දළ දේශීය නිෂ්පාදනය බිලියන 8.718ක් වැඩි වන බවයි. එමෙන්ම කාර්මික නිෂ්පාදනය එක් බිලියනයකින් වැඩි වන විට දළ දේශීය නිෂ්පාදනය බිලියන 3.201ක් වැඩි විය. තවද සේවා නිෂ්පාදනය එක් බිලියනයකින් වැඩි වන විට දළ දේශීය නිෂ්පාදනය බිලියන 1.731 වැඩි විය. ආකෘති ත්‍රිත්වයෙහිම අනුසීහුමද හොඳ යැයි කිව හැකිය. සේවා අංශය වර්ධනයෙහිලා විශාලම දායකත්වය සපයන්නේ තොග හා සිල්ලර වෙළදාම් අංශයයි. දෙවනුවට ප්‍රවාහනය හා සන්නිවේදන අංශය දායකත්වය සපයයි. තොග හා සිල්ලර වෙළදාම් නිෂ්පාදනය එක් බිලියනයකින් වැඩි වන විට සේවා අංශය 3.145 බිලියන වැඩි විය. ප්‍රවාහනය හා සන්නිවේදන නිෂ්පාදනය එක් බිලියනයකින් වැඩි වන විට සේවා අංශය 4.079 බිලියන වැඩි විය.

**මුඛ්‍ය පද** *: දළ දේශීය නිෂ්පාදිතය, කාර්මික අංශය, කෘෂිකාර්මික අංශය, සේවා අංශය*